ජනප්‍රිය තරු මට්ටමේ පුද්ගලයින් හා සිදුකෙරෙනා පුවත්පත් සාකච්ඡාවන් නිරීක්ෂණය කිරීමේදී දක්නට හැකි කරුණක් වන්නේ, ස්ත්‍රී පුරුෂ භාවය අනුව සිදුකෙරෙනා ඒකාකෘතික කිරීම් සුලභ වීමයි. විශේෂයෙන්ම කාන්තාවක් හා සිදුකෙරෙන සාකච්ඡාවකදී, ඇයගේ වෘත්තියට වඩා ගෘහ ජීවිතයට මූලිකත්වය දිය යුතු නොවේද/මූලිකත්වය ලබාදෙන්නේද වැනි ප්‍රශ්න සහ යෝජනා කිරීම්, ඇය වෘත්තිය ජීවිතය පසෙකලා බිරිඳ, ගෘහණිය, මව යන භූමිකාවන්ට සීමා විය යුතුයැයි සැමියා නොපවසන්නේද හෝ සැමියා වෘත්තිය ජීවිතයට අවසර දෙන්නේද වැනි ප්‍රශ්න ඇසෙනු දැකිය හැක. කෙසේ නමුත් මෙවන් ප්‍රශ්න පිරිමින්ගෙන් ඇසෙනුද දක්නට නොලැබේ.

මෙසේ බැලූ විට, යම් කිසි වෘත්තියක් ඔස්සේ ජනප්‍රියත්වයක් අත්පත් කොට ගත් කාන්තාවකගෙන්, සාම්ප්‍රදායිකව සමාජය විසින් කාන්තාවට පවරා ඇති භූමිකාවන්ට පළමු තැන දී ඇගේ වෘත්තිය දෙවන තැනට තැබිය යුතුයැයි/යුතුදැයි යෝජනා කිරීම/ප්‍රශ්න කිරීම කෙතරම් උචිත වේද? එසේම එවන් ජනප්‍රියත්වයක් ඇති පිරිමියෙකුගෙන් එවන් ප්‍රශ්න නොඇසීම ඔස්සේම, මෙම පුවත්පත් සාකච්ඡාවන් කාන්තාවගේ භූමිකාව සම්බන්ධයෙන් ඒකාකෘතික කිරීම් සමාජගත කිරීමක්, ඒ ඔස්සේ කාන්තාවට වෙනස් ලෙසින් සැලකීමක් නොකරන්නේ යැයි ඔබ සිතන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #Divaina